
ලංකාවිත්ති
LANKA VITHTHI



LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam

# සිංහල අළුත් අවුරුද්ද සහ සිංහල අනන්‍යතාව

**ශ්‍රී**ලාංකික සංස්කෘතියේ විශේෂ අංගයක් සහ උරුමයක් ද වන සිංහල අවුරුද්ද අනාදිමත් කාලයක සිට අප රටේ ඉතා ප්‍රීතියෙන් යුක්තව ගෙවෙන විශේෂ දිනයක් බව අපි දනිමු. එම සිංහල අවුරුද්ද පිළිබඳ අද වැඩිහිටි වියේ පසුවන අප කාටත් ඇති බොහෝ මතක රැඳී ඇත්තේ අපේ ළමා කාලය තුළය. සිංහල අවුරුද්ද ගැන අද දවසේ නොව කොයි දවසේ වුවද මතක් කළත් සෑම දෙනාටම කියන්නට ඇත්තේ ඒ අතීතයේ මතක සටහන් ය. එය එතරම් සුන්දර අයුරින් සටහන්ව ඇත්තේ අවුරුදු ප්‍රීතිය සැබැවින්ම විඳගනු ලබන්නේ ළමයින් විසින් නිසා විය හැකි ය.

බොහෝ බටහිර රටවල ජනයා ජනවාරි පළවෙනිදා අලුත් අවුරුදු දිනය ලෙස ගෙන එදින ප්‍රීතියෙන් ගෙවති. එය නිවාඩු දිනයක් ලෙසින් ද නියම කර ඇත. තවත් රටවල ඒ රටවලට ආවේණික විශේෂ උත්සව දිනයක් වෙයි. එහෙත් සිංහල අවුරුද්ද වැනි දිනයක් ලෝකයේ කොහේවත් නැතැයි මගේ කල්පනාවයි. ඒ අන් කිසිවක් නිසා නොව සිංහල අවුරුද්ද හා සම්බන්ධව ඇති නැකැත් පිළිපදින විශේෂිත ආකාරය නිසා ය.

නැකතට ලිප්ගිනි නිවා වැඩ නැවැත්වීම, නැකතට ලිප ගිනි දැල්වීම, නැකතට ආහාර ගැනීම මේ ආදී සිංහල අවුරුද්ද දා මූලික කාර්‍යයන් සිදු කෙරෙන්නේ සුබ මොහොතින් හෙවත් නැකැත් වේලාව අනුවය. වෙනත් ආකාරයකට කිවහොත් මුලු මහත් ලංකාවේම මාතර ද, කොළඹ ද, යාපනයේ ද, හලාවතද මේ ආදී සියලු තන්හි ගෙවල්වල ඔර්ලෝසුවේ විනාඩියක්වත් වෙනස් නොවී එකම වේලාවට ලිපවල් නිවා දැමේ. එකම වේලාවට ලිප් පත්තු කෙරේ. එපමණක් නොව ආහාර පිස එකම වේලාවට මුලු මහත් ලංකාව පුරා පිඟානේ බත්පිඩ කටට ගනී. අප රටේ හැර මේ විදියේ ආශ්චර්‍යයක් සිද්ධවන්නේ වෙන කොයි දීපංකරේද?

ලන්ඩනයේ බොහෝ කලක් වෙසෙන මගේ මිතුරෙක් කාලයක් තිස්සේ මට මෙසේ කීවේය. “කොහොම හරි සිංහල අවුරුදු කාලෙට ලංකාවට ගිහින් දරුවො දෙන්නට අවුරුදු චාරිත්‍ර පෙන්නන්න ඕන. ඒ දරුවො තාම දන්නෙ නෑ සිංහල අවුරුද්ද මොකක්ද කියලා.”

කෙසේ හෝ ගිය වසරේ ඔහු ඒ අභිප්‍රාය ඉටුකර ගත්තේය. ආපසු පැමිණි මා මිතුරා ඉතා සතුටින් කීවේ තම දරුවන් සිංහල අවුරුදු සොම්නස විඳගත් අපූරුව ය.

කාලය විසින් බොහෝ දේ වෙනස් කරනු ලැබීය. ත්‍රස්තවාදය හා කුරිරු යුද වාතාවරණය අවුරුදු විසිපහක් පුරා අවුරුද්දේ සැබෑ ප්‍රීතිය සොරකම්කර ගත්තේය. එහෙත් රණවිරුවන්ගේ පරිත්‍යාගයේ මහිමයෙන් යළිත් අපේ දේශයට සැබෑ සිංහල අවුරුදු අසිරියේ කිරණ පතිතවෙන ලකුණු පෙනේ. මේ මොහොතේ ගම රට ගොස් එන්නට මටද සිතේ. 2003 සිංහල අවුරුද්දට දින කීපයකට පෙර යළි නොඑන්නටම නික්ම ගිය කපුගේ ගාන්ධර්වයාණන් මට සිහිවේ. ඔහුගේ හඬද මට ඇසේ........ “ *මං එනතුරු ඉඳිකඩ ළඟ ඉන්නවාද අම්මේ.....?* ”

# හිරුගෙන් උපන් සිංහල අවුරුද්ද



**ආචාර්‍ය දයා අමරසේකර**
**පේරාදෙනිය විශ්වවිද්‍යාලය**

**ශ්‍රී** ලාංකීය ග්‍රාමීය ජනජීවිතයේ ප්‍රධානතම සංස්කෘතික උළෙල සිංහල අළුත් අවුරුදු උත්සවයයි. එහි මුළු ව්‍යුහයම සකස්වී ඇත්තේ නැකැත් සහ චාරිත්‍ර පද නම් කරගෙනය. නැකැත් නක්ෂාත්‍රය මතද, චාරිත්‍ර, ආගමික මති මතාන්තර සහ ජන විශ්වාස මත ද ගොඩ නැගී ඇත. සිංහල අළුත් අවුරුද්ද වෙනුවෙන් නැකැත් සිරිත් අකුරටම ඉටුකිරීමට අපේ පැරැණ්ණෝ වගබලා ගත්හ. මානව විද්‍යාත්මකව බලතහොත් මේ තත්වය මිනිසා සහ ඔහුගේ තීරණ තේරුම් ගැනීමට හොඳ පසුබිමක් වන්නේය.

එක්තරා විශ්වාස පද්ධතියක් හිස දරාගෙන ජීවිතයේ හැම කටයුත්තකදීම ඒවා ආලෝක යක් කරගත් පැරණි මිනිසා තේරුම් ගැනීමට අළුත් අවුරුද්ද හොඳ දවසකි. කෙතට, කුඹුරට ලන්දට, තමා අවට පරිසරයට දැඩිසේ බැඳුණු ආදි ගැමියා ඉර හඳ වැනි ස්වාභාවික වස්තූන්ට දේවත්වයක් ආරෝපණය කළේ තම දිවිය සරුකර දෙන මහ පොළවට ඉන් අප්‍රමාණ බල පෑමක් ඇතිවන නිසා ය. කෙසේ වුවද නූතන නවීකරණය වූ සමාජය පැරණි ගති සිරිත් හෙළාදකී. නැකැත් අවැසි නැතැයි කියති. එහි ඇත්තේ විශ්වාසයක් පමණකැයිද ඒනිසා ඒවායේ පදනමක් නැතැයි ද තර්ක කරති. අවුරුද්ද යනු තවත් එක් දවසක් පමණකැයි සිතා ඇති තරම් කා බී සතුටු වෙති. මේ අදහස් ඇත්තෙන්ම විචාරාත් මකද? අවුරුදු දා අපි මේ අළුත් අදහස් ගැන සිතමු.

අවුරුද්දේ කේන්ද්‍රීය අංශය හිරුය. අවුරුද්ද සැබැවින්ම හිරුගෙන් උපන් එකකි. සොබා දහමේ මැවුම්කරුවා හිරුය. හිරු රාශි දොළහේ ගමන්කර නැවත මේෂ රාශියට පැමිණීම මේදින සිදුවෙතැයි විශ්වාසිතය. භූ විද්‍යාත්මකව බලන විට ද මාර්තු අප්‍රේල් ආසන්නයේ දී හිරු පෘථිවියට ආසන්නව ගමන්ගනී. ඔහු දුරස් වූ කල්හි පරිසරය මළානික වේ. මෙම වෙනස ඇත පෙරදිග ජනතාව තේරුම්ගන්නේ සොබාදහමේ මැවුම්කරුගේ මිය යෑමක් ලෙසිනි. එහෙත් වසන්තය උදාවෙත්ම මළහිරු යළි උපත ලබා ලොවම පුබුදුකරයි. මේ අසිරිමත් මොහොත අවුරුදු උදාව ලෙස ආදි ජනතාව නම් කරන්නට ඇත. අප රටේ වසන්ත කාලය ඇරඹෙන්නේ මහ කන්නය නිමාවී අටුකොටු පිරී ඉතිරී යාමෙනි. හිරු මීන රාශියේ ගතකරන අවසාන දිනය පරණ අවුරුද්ද ලෙසත්, මේෂ රාශියේ ගතකරන ප්‍රථම දිනය අළුත් අවුරුදු දිනය ලෙසත්, මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වන සංක්‍රාන්ති කාලය **නොනගතය** ලෙසත් නම් කෙරේ. මේ සරල විග්‍රහය අපට පෙන්වන්නේද සරල සත්‍ය සිද්ධියකි. එනම් හිරුගේ ගමන අපගේ ජීවිතයට කරන බලපෑමයි. ඒ ඒ රටවල සංස්කෘතීන්ට අනුව ඒ බලපෑම අර්ථ දක්වා ඇත.

විශ්වය එකිනෙකට වෙනස් ශක්තීන්ගෙන් යුත් ග්‍රහ මණ්ඩල යකින් සැදුනකි. එහි බලවත්ම ග්‍රහයා සූර්යයාය. සූර්යයා ඇතුළු හැම ග්‍රහයෙකුම ජීවීන් කෙරෙහි බලපායි. විශ්වය පිළිබඳ මෙම මූලධර්ම පදනම් කරගෙන නක්ෂාත්‍රය ගොඩනැගී තිබේ.

අප කියවා ඇති පරිදි අංශක 360 ක් වූ ලෝක ගෝලය අධ්‍යන පහසුව සඳහා මේෂ, වෘෂභ ආදී වශයෙන් කොටස් 12කට බෙදේ. නැවත සූර්‍යයාගේ චාරය අනුව උත්තරායනය හා දක්ෂිණායනය යනුවෙන් දෙකොටසකි. මේ අයණ චාර නිසා ඍතු භේද හටගැනේ. උත්තරායනයේදී සිසිර, වසන්ත හා ග්‍රීෂ්ම යන ඍතු තුනකි. දක්ෂිණායනයේදී වර්ෂා, සරත් හා හේමන්ත නම් ඍතු තුනයි. නැවත ප්‍රභව, විභව ආදී වශයෙන් වර්ෂ සංවත්සර 60 කි. ඒ වර්ෂ සංවත්සර 60 විශේෂ වශයෙන් බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර යනුවෙන් විංශති තුනකට බෙදේ. නැවත එක් විංශතියක් විෂ්ණු යුගය, බ්‍රහස්ති යුගය, අග්නි යුගය ආදී වශයෙන් යුග 12 කට බෙදේ.

නැකැත් යනුවෙන් අදහස් කරන්නේ හොඳ වෙලාවකි. හොඳ දේකට හොඳ වේලාවක් තෝරා ගැනීම අස්වාභාවික නොවේ. මෙහිදී මුල් වී ඇත්තේද චන්ද්‍රයාගේ වෙනස්වීමයි. නැකතට විද්‍යාත්මක හා ශාස්ත්‍රීය පදනමක් ඇති බව පෙනේ. නැකැත් අනවශ්‍යයයි දක්වන මතය නම් ග්‍රහ වස්තූන් මිනිසාගේ ඉරණම වෙනස් කිරීමට බල නොපාන්නේ ය යන අදහසයි.

ඉරණම යනුවෙන් අප අදහස් කරන්නේ ජීවිත කාලය පුරා සිදුවූ දැවැන්ත සිදුවීම් මාලාවකි. චන්ද්‍රයා වැනි ග්‍රහයන්ගේ පදාර්ථ වස්තු දෙකක් අතර යම් සබඳතාවක් පවතිනබව විද්‍යාත්මක සත්‍යයකි. එය හැඳින්වෙන්නේ ගුරුත්වාකර්ෂණය යනුවෙනි. ඇසට නොපෙනෙන කුමක් හෝ බලවේගයක් අප වටා ඇති බව අප පිළිගත යුතුය. මිනිසුන්ගේ ශක්තිය විවිධය. ගති පැවතුම් විවිධය. එහෙත් ඔව්හු සියල්ලෝ මිනිස්සු වෙති. මේ වෙනසට පුද්ගලයින්ගේ ජාන බලපාන බව විද්‍යාව විසින් පිළිගනු ලැබ ඇත. ජ්‍යොතිශ්‍යය ඒ අදහස පිළිගන්නේ ඒ වෙනසට පුද්ගලයාගේ ජන්ම නැකත බලපාන බව දැක්වීමෙනි.

අවුරුදු චාරිත්‍රවල සමාජීය වැදගත්කම මුදල්වලින් මැනීමට බැරි දෙයකි. චාරිත්‍රයයි දෙයක් නොතිබුණා නම් අවුරුද්දට අපේකම පිළිබඳ හැඟීම අපේ මිනිසුන්හට දැනෙන්ට මහක් නැත. අවුරුද්ද යයි සම්මත නැකැත් උළෙලක් නොතිබුණා නම් ඥාතීන්ගේ, මිතුරන්ගේ පවුල් එකතුවට හොඳ තවත් දවසක් අවුරුද්දටම ලැබෙන්නේ නැත. අනෙක් අතට ජ්‍යොතිශ්‍යය මගින් මිනිසාගේ කුසල් අකුසල් හෙළිකරන බවත් අවුරුද්දේ සිතිය යුතු කාරණයකි. කුසල් ඵල දෙන කාලය හොඳ කාලය ලෙසත්, ඵල නොදෙන කාලය නරක කාලය ලෙසත් අප සිතිය යුතුය. මෙසේ බලතහොත් පුද්ගලයෙකුගේ කේන්ද්‍රය යනු පින්පව් පිළිබඳ තෝම්බුවකි.

සමස්තයක් ලෙස සිංහල අළුත් අවුරුද්ද ගොඩනැගී ඇත්තේ අංශ තුනක් මුල්කරගෙනය. ජ්‍යොතිශ්‍යය, පාරම්පරික ඥානය සහ යාතුකර්ම ඒ අංශ තුනය. ඉනිදු ජ්‍යොතිශ්‍යය සෙසු අංශ දෙකට ජීවයදෙමින් නැගී සිටී. ජ්‍යොතිශ්‍යය ජීවිතයට බලපාන්නේ කෙසේදැයි තේරුම් ගැනීම ද අළුත් අවුරුද්දේ වැදගත් ය.

අප ඉහත පෙන්වාදුන් අන්දමට අවුරුද්දේ නිර්මාපකයා හිරුය. ජ්‍යොතිශ්‍යය මිනිස් ජීවිතය හා බැඳෙන්නට හේතුවද හිරුය. හිරුගෙන් ආලෝකය ලබන යම් ජීවී හෝ අජීවී වස්තුවක් යම්කිසි කිරණ ප්‍රමාණයක් තමන්ගේම ගුණයෙන් යුතුව චුම්බක තත්වයට පත්වන අතර ඉතිරිය ඒ වස්තූන්ගෙන් පරාවර්තනය වේ. එය සියළු ග්‍රහයන්ට පොදු සත්‍යයකි. පොළවේ සියළු ජීව වස්තූන්ට ග්‍රහයන්ගේ කිරණ චුම්බකත්වය ඇතිවන්නේ මේ මූලධර්මය අනුවය.

අවුරුද්දට නැකැත් අවශ්‍ය නැතැයි කීම පහසුය. ජ්‍යොතිශ්‍යය මිත්‍යාවක් ලෙස සැලකීමද පහසුය. එහෙත් ඒ හා බැඳුණු වටිනා සංස්කෘතිකාංග ඉවත් වූ සමාජයක ඒ අඩුව පුරවනු ලබන්නේ කෙසේද? සහ, කා විසින්ද? යන්න ද මේ ලබන සිංහල අළුත් අවුරුද්දේ අප විවේකීව සිතා බැලිය යුතු ය.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**ආපද්‍යුන්මාර්ගගමනෙ කාර්‍යකාලාත්‍යයෙෂු ච**
**කල්‍යාණවචනං බ්‍රෑයාදපෘෂ්ටොපි හිතො නර:**

***අර්ථය*** : **විපතක් ඇති විටද, නොමග යන විටද, කළයුතු වේලාව ඉක්මවා යනවිටද, නොවිමසුව ද, හිතවත් මිනිසා හොඳ වචනයක්ම කියන්නේ ය.**

**ලො**ව පහළ වූ උදාර මිනිසුන් බොහෝ කැපකිරීම් කර ඇත්තේ හුදෙක් ආත්මාර්ථය සලසා ගැන්ම සඳහාම නොවේ. මුළු මහත් මිනිස් වර්ගයාගේම යහපත ප්‍රාර්ථනා කරගෙනය. ලොව වරෙක තැවෙන්නේත්, වරෙක නිවී සැනසෙන්නේත් මිනිසා නිසාමය. මිනිසාගේ සිතුවිලි නපුරට යොමුවී මිනිසාට එරෙහි වූ දාට ලොව ගිනිගෙන දැවෙනවා ඇත. මිනිසා මිනිසා කෙරෙහි සෙනෙහසින් පිබිදුණු දාට ලොව නිවී සැනසීමට පත්වේ. එනිසා ලොව වාසනාවන්ත කිරීමටත්, ලොව කෙනෙකුට ජීවත්වීමට අපහසු තැනක් කිරීමටත් හැකියාව පවතින්නේ මිනිසා සතුවය.

කෙනෙකු ආකාර තුනක් වරද්දාගැනීම් කරගන්නා විට ඒ වැරදුණ කෙනාගේ ඇරයුමකින් තොරවම එම වැරදි නිවැරදි කරගැනීම සඳහා වැරැද්ද යහපත් ලෙස පෙන්නා දෙන තැනැත්තා හිතවතෙකු බව මෙම පද්‍යය පෙන්වා දෙයි.

කෙනෙකුට ජීවිතයේ උතුම් සැනසුම හා සතුට ලබා ගතහැකි වන්නේ අධ්‍යාත්මික සුන්දරත්වයට ළංවීමෙනි. ඒ සඳහා ක්‍රියා කළ හැක්කේ මානව දයාව, සානුකම්පිකබව, කෘතවේදීබව හා මිත්‍රත්වය ආදි උදාර ගුණධර්මවලින් පිරිපුන් කෙනෙකුට පමණකි.

මිනිසෙකු උපදින්නේ තනිව වුවද ඔහුට තනිවම ජීවත්වීමට නොහැකිය. එනිසා ඔහුට අන් අයගෙන් උදව් උපකාර අවශ්‍යවේ. පාලුව, හුදකලාව හා කාන්සිය මෙන්ම ජීවන බර සැහැල්ලුලුකර ගැනීමට වෙනත් අයගේ සහාය අවශ්‍ය වේ. එසේම ගැටළුවක් කරදරයක් පැන නැගි විටක එය විසඳාගැනීමට තවත් කෙනෙකුගේ පිහිට පතන්නට සිදුවේ. එබැවින් මිනිසු සමාජය තුළ අපමණ ගැටළු වලින් පැනනගින දුක තාපය සමනය කරගැනීමට සත්පුරුෂයන්ගේ සහාය උදව් උපකාර හා උපදෙස් විශේෂයෙන් පිටුවහලක් වේ.

ජීවිතයේ අරමුණු බෙහෙවින් සංකීර්ණ තත්වයක් තුළ පවතින සමාජයක ජීවත්වන පුද්ගලයාගේ ජීවිතයද එම සංකීර්ණ බව නිසාම ව්‍යාකූලත්වයට පත්වන්නේය. වත්මන් සමාජයේ ඇතැම් අයගේ ජීවිත අවුල් වූ නූල් පන්දුවක් මෙන් නිවැරදි කර ගැන්මට නොහැකි අන්දමට සංකීර්ණ වී ඇත. එහෙත් එවැනි වැරදි මග යන්නෙකුගේ ජීවිතය නිසිමගට ගැනීමට එය අවබෝධකර දීමට යමෙකු උපකාර කරන්නේ නම් එය ඔහුගේ ජීවිතය ප්‍රබෝධමත් කරගැනීමට බෙහෙවින් බලපාන බව කිවහැකිය.

නොයෙක් අඩුපාඩු මධ්‍යයේ සිට අපි එකිනෙකාගේ අඩුලුහුඬුකම් සොයන්නට, හරි වැරදි සොයන්නට කාලය මිඩංගු කිරීම අමනොඥ ක්‍රියාවකි. තමන් සමග ජීවත්වන කෙනෙකුට හදිසි කරදරයක් අත්වැරැද්දක් සිදුවූ වෙලාවක එය යටි හිතේ තබාගෙන ඒ ගැන සතුටු වන අය අප අතර සිටිතත් සිනාමුසු මුහුණින් එකට ජීවත්වෙමින් එකට කටයුතු කළත් සිතිවිලි වශයෙන් ඔවුන්ගේ අදහස් බොහෝ දුරස්ය. මෙවැනි අපූරු යාළුවන්ට වඩා කෙනෙකුට කරදරයක් ඇතිවූ විටෙක ඉන් ගොඩ ඒම සඳහා උදව් උපකාර කරන්නේ නම් කෙනෙක් නිසිමග තෝරාගත් නොහැකිව වල්මත්ව නොමග යන විටක ඔහු කෙරෙහි සානුකම්පිකව බලා ඔහු නිසිමගට යොමුකරන්නේ නම් හා නිසි කල කටයුතු ඉටුකර නොගෙන ජීවිතය අවුලක් කරගන්නා විටක නියමිත කලට නියමිත කාරණය නිමාකිරීමට උපදෙස් දෙන්නේ නම් ඔහුගේ පවුල සමබරතාව කින් පවත්වාගෙන යාමට හැකිවන්නේය. එ කල්හි ඔවුන්ගේ ජීවිතය හරවත් රසවත් එකක් බවට පත්වන්නේය. එනිසා මනඃකල්පිත ලෝකයන් මවාගෙන ඒවායේ සතුට සොයන්නට නොගොස් උතුම් හිතවතුනගේ සදුපදේශයන් පිළිපදිමින් නිසිමග යමින් නිවැරදි දැම කරන්නේ නම් ජීවිතයේ සතුට ළඟකරගත හැකිය.



***♦ පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 UK**


**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**